Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර (ශිල්පීය නොවන) ඛණ්ඩ 02 සේවා ගණයේ නේවාසිකාගාර පාලක/පාලිකා III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම**

බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නේවාසිකාගාර පාලක/පාලිකා III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය ඇති ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශ්වයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

1. 1.1 *මාසික වැටුප් පරිමාණය* : මම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව MN1 - 2016 වන අතර, රු. 27,140 - 10 x 300 - 11 x 350 -10 x 495 - 10 x 660 - රු. 45,540 වේ.
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන 11 ප්‍රකාරව වැටුප් ගෙවනු ලැබේ).

1.2 *දීමනා* : රජය විසින් අනුමත ජීවන වියදම් දීමනා වැටුපට අමතරව ගෙවනු ලැබේ.

2. *වයස් සීමාව* : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2017.11.17 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි අයදුම්කරුවන් හට මෙම තනතුර සඳහා ඉල්ලුම් කල හැකිය. පුරප්පාඩු සඳහා බඳවා ගනු ලබන දිනට උපරිම වයස් සීමාව ඉක්මවා නොතිබිය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

3. *අධ්‍යාපන සුදුසුකම්* :

*(අ)* සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

*සහ*

*(ආ)* අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එක (01) ක් වත් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

*සහ*

4. *වෘත්තීය සුදුසුකම්* : විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ අනුමත ආයතනයකින් සමාජ විද්‍යාව / මනෝ විද්‍යාව පිළිබඳව අවම වශයෙන් සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබිය යුතුය.

5. *සේවා කොන්දේසි* :

- මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහතිකය (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතුය.)
- අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව සේවා කොන්දේසි තීරණය වේ.
- තෝරාගනු ලබන අයදුම්කරුවන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.

6. *කායික සුදුසුකම්* : සෑම අපේක්ෂකයෙකුම බස්නාහිර පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7. *අනෙකුත් සුදුසුකම්* :

*(අ)* අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
*(ආ)* මනා චරිතයකින් යුක්ත විය යුතුය.
*(ඇ)* 2017.11.17 දිනට පූර්වාසන්න වසර 03 ක කාලය තුල බස්නාහිර පළාත තුල ස්ථිර පදිංචිය තිබිය යුතුය.

8. *බඳවා ගැනීමේ ක්‍රමය.-* සුදුසුකම්ලත් අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීමෙන් අනතුරුව බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

9. *අයදුම් කිරීමේ ක්‍රමය.-* මෙම *ගැසට්* නිවේදනය සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව, ඒ 4 ප්‍රමාණයේ (සෙ. මී. 21x23) කඩදසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කර ගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2017.11.17 දිනට පෙර "ලේකම්, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය (බ.ප.), තැ.පෙ. 566, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නේවාසිකාගාර පාලක/පාලිකා III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම - 2017**" යනුවෙන් සඳහන් කළ යුතුය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය). ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

මෙම නිවේදනයට අනුව අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කරන අවස්ථාවකදී ඔවුන් විසින් අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් එම අය හට පත්වීම ලැබීමට ඇති හිමිකම අවලංගු කරනු ලැබේ. මෙම අයදුම්පත් කැඳවීමේ *ගැසට්* නිවේදනයේ ඇතුළත් කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණක් වෙතොත් ඒ පිළිබඳව බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

එන්. නිල්වල,
ලේකම්,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන
සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය (බ.ප.).

තැ. පෙ. 566,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර (ශිල්පීය නොවන) ඛණ්ඩ 02 සේවා ගණයේ නේවාසිකාගාර පාලක/පාලිකා III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම***

01. I. මුලකුරු සමග නම :.............................................................................................................

II. මුලකුරු වලින් හැඳින්වෙන නම් :..............................................................................................

.........................................................................................................................................

02. I. ස්ථිර ලිපිනය :.....................................................................................................................

II. රාජකාරි ලිපිනය :..................................................................................................................

III. දුරකථන අංකය : පෞද්ගලික :.............................................. රජකාරි :.........................................

03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :.........................................................................................

04. I. උපන් දිනය :.................................................................

II. 2017.11.17 දිනට වයස : අවු. :................................, මාස :................................, දින :................................

(සම්මුඛ පරීක්ෂණයේ දී උප්පැන්න සහතිකයේ මුල් පිටපත ඉදිරිපත් කළ යුතුය.)

III. ජා. හැ. අංකය :..............................................................

05. *අධ්‍යාපන සුදුසුකම්* :

(සහතික මගින් සනාථ කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේදී සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.)

අ.පො.ස. (සා.පෙළ) විභාගය :

වර්ෂය :................................ විභාග අංකය :................................

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|
| 1. .................................................................. | .......................................... |
| 2. .................................................................. | .......................................... |
| 3. .................................................................. | .......................................... |
| 4. .................................................................. | .......................................... |
| 5. .................................................................. | .......................................... |
| 6. .................................................................. | .......................................... |
| 7. .................................................................. | .......................................... |
| 8. .................................................................. | .......................................... |

අ.පො.ස. (උ.පෙළ) විභාගය :

වර්ෂය :................................ විභාග අංකය :................................

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|
| 1. .................................................................. | .......................................... |
| 2. .................................................................. | .......................................... |
| 3. .................................................................. | .......................................... |
| 4. .................................................................. | .......................................... |

06. මෙම බඳවා ගැනීමේ *ගැසට් නිවේදනයේ* 04 අනුව ඉල්ලුම් කරන තනතුරට අදාළ වෘත්තීය සුදුසුකම් :

පාඨමාලාවේ නම :..........................................................................................................................................................

පාඨමාලාවේ කාල සීමාව :.................................... සිට .......................................... දක්වා

පාඨමාලාව හදාරන ලද ආයතනය :.........................................................................................................................

සහතිකවල වලංගු දිනය :.................................................................

.......................................................................................... වන මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි මා විසින් සපයන ලද තොරතුරු අසත්‍ය බව හෝ සාවද්‍ය බව හෙළි වුවහොත් එසේ සාවද්‍ය බව හෙළි වූයේ තෝරාගැනීමට පෙර නම් මෙම තනතුර සඳහා මා නුසුදුස්සෙකු බවත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් කිසිදු වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකිරීමට යටත් වන බවත් දනිමි. තව ද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ නීති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

.................................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :............................................

07. *දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*

.................................................................................. මයා/මිය/මෙය මෙම දෙපාර්තමේන්තුවේ .......................................... වශයෙන් ....................... දින සිට සේවය කරන බවත්, පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර වෙනත් විනයානුකූල දඬුවමක් ලබා නොමැති බවත්, සේවා කාලය තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇති/නැති බවත්, පූර්වාසන්න වසර 02 තුළ වැටුප් රහිත නිවාඩු ලබා ඇති/නැති බවත් අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු නිලධාරියාගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත් සහතික කරමි.

දිනය :.........................................

.................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න.)